**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - 2022**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.625,000 ක් වටිනා කැබ් රථය භාවිතයෙන් ඉවත් කර තිබූ නමුත් මේවන තෙක් අපහරණය කර නොතිබූ අතර එහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු ගොඩනැඟිලි සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද රු. 1,522,918 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි . | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.134,083 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී සභාව විසින් ඉටු කරන ලද ව්‍යාපෘතීන් 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු වියදම වෙනුවෙන් දෙවරක් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ණයහිමි ශේෂ රු.834,091 ක් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී සභාව විසින් ඉටු කරන ලද විවිධ ව්‍යාපෘතීන් වෙනුවෙන් ගෙවිය යුතු වියදම රු.907,071 ක් සඳහා වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී සභාව සතු ගල්ඇන්දකුට්ටිය ප්‍රජාශාලාව ඉදිකිරීම වෙනුවෙන් දරන ලද වියදම සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධනිත කිරීමේදී රු.568,145 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.15,511,550 ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවේ අනියම්/ ආදේශක සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ 3% ක දායකත්වය වෙනුවෙන් රු.316,500 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.107,040 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 29 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.348,309,259 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,027,653 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොග ලේඛන හා විස්තරාත්මක උපලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 5,272,465 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (4) | 2022 වර්ෂයේදී සභාව සතු බැකෝ ලෝඩරයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104(4) ප්‍රකාරව අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ. 104(4) ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,459,120 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,740,481 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,935,700 | 262,074 | 304,902 | 132,894 | 3,934,500 | 993,730 | 942,960 | 175,722 |
| (ii) | කුලී | 7,647,500 | 2,883,350 | 3,481,238 | 228,401 | 6,721,000 | 2,467,485 | 2,155,375 | 826,289 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 907,000 | 1,239,140 | 1,337,940 | 128,200 | 777,000 | 991,425 | 902,425 | 227,000 |
| (iv) | වෙනත් ආදායම් | 4,626,400 | 4,223,865 | 4,518,905 | 200,432 | 7,864,400 | 4,668,375 | 4,172,903 | 495,472 |
| | | 17,116,600 | 8,608,429 | 9,642,985 | 689,927 | 19,296,900 | 9,121,015 | 8,172,663 | 1,724,483 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු.168,919 ක් වූ අතර, වර්ෂය අවසානයට වරිපනම් ඒකක 116 කට අදාළව රු.124,545 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයන් හඳුනාගෙන 2022 සැප්තැම්බර් 30 දිනැති අංක 2300 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල ප්‍රදේශවලින් වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කාමර 43 ක් පැවති අතර කඩ කාමර 14 කින් රු.160,650 ක හිඟ ආදායමක් අය විය යුතුව පැවතුණි. ඉන් කඩ කාමර 03 කින් රු. 25,000 ට වඩා වැඩි ශේෂයක් අය විය යුතුව පැවතුණි. | කොටස් වශයෙන් මුදල් අය කර ගනිමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඈ) | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 12 ක් වෙනුවෙන් අයවිය යුතු රු.316,500 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල හිඟ දැන්වීම් පුවරු ගාස්තු අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.723,635 ක් හා මුද්දර ගාස්තු රු.36,086,509 ක් අය විය යුතුව තිබුණි. | ඉදිරියේදී කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කසළ දිරන හා නොදිරන වශයෙන් වර්ග කිරීමකින් තොරව එක්රැස් කිරීම හේතු කරගෙන කසළ වර්ග කිරීම සඳහා සභාවේ කම්කරුවන් යොදවා තිබූ අතර නොදිරන කසළ බැහැර කිරීම සඳහා පරිසර හිතකාමී ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | සනීපාරක්ෂක භූ පිරවීම් වැනි පිළිගත් ක්‍රමවේදයක් අත්හදා බලමින් සිටින බව හා පොලිතින් විනාශ කිරීමට අවශ්‍ය වන waste incinerator යන්ත්‍රයක් ඉල්ලුම් කර ඇති බව | විධිමත් කසල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ රාජකාරි සිදු කරන දෛනික/ ආදේශක සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට බැර කළ යුතු 3% දායක මුදල නිසි පරිදි නොගෙවීම නිසා 2013 අගෝස්තු මස සිට 2022 අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.376,930 ක අධිභාර මුදලක් සභාව විසින් ගෙවීමට සිදුවී තිබුණි. | සභාව විසින් ගෙවන ලද අධිභාර මුදල නැවත අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | දායක මුදල් නිසි පරිදි ගෙවිය යුතු අතර, අලාභය සම්බන්ධයෙන් මු.රෙ. 156 ට අනුව කටයුතු කළයුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලි හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක PR/01/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව සඳහා විදුලි උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.1,022,750 ක වියදමක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | ප්‍රතිපාදන නොමැති බැවින් අදාළ ගෙවීම් නතර කිරීමට සිදුවී ඇති බව විදුලිබල මණ්ඩලය දැනුම් දී ඇති බව . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාවේ මාර්ගයක් අවහිර වන සේ, නිසි සංවර්ධන බලපත්‍රයක් නොමැතිව ඉදිකර තිබූ තාප්පය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිසි සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සිදු කර තිබෙන ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) වගන්තියෙන් බැහැරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දින 56 ක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකුට නිවාඩු දින වැටුප් ලෙස රු.122,108 ක් ගෙවා තිබුණි. | කොවිඩ් 19 වසංගතය පැවති කාලවකවානුව තුල ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකළ බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු.17,804,377 ක ඇස්තමේන්තුගත වටිනාකම ඇති කර්මාන්ත 04 ක රු.3,626,711 ක නිම් වැඩ කොටසක් ඉටු කර ඉදිකිරීම් නතර කිරීම හේතුවෙන් ඉදිකරන ලද කොටස් විනාශ වෙමින් පැවතුනු අතර ඉදිකිරීම් ආරම්භ කිරීම තුලින් බලාපොරොත්තු වූ අරමුණද ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිපාදන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව. | ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකුට හා සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව කාර්යාලයීය රාජකාරි හා වෙනත් රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,246,076 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | පුරප්පාඩු පවතින තනතුරුවල රාජකාරි පවරා ඇති බව. | තනතුරට නියමිත රාජකාරි පැවරිය යුතු වේ. |